

# සුරක්ෂිත රට රස්සාවකට නිවැරදි මාර්ගය

## 01. වෘත්තීය සුදුසුකම් සපුරාගන්න. (පහත සඳහන් එක් ආකාරයකට)

i. පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් හෝ ඩිප්ලෝමා පාඨමාලාවක්

ii. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) අනුමැතිය ලත් වෘත්තීය පුහුණු ආයතනයකින් වෘත්තීය පුහුණු පාඨමාලාවක්.

- TVEC යටතේ ලියාපදිංචි වී ඇති සියලුම ආයතනවල පාඨමාලා
  *https://nvq.gov.lk/Insreg_Home/Insreg_Institute_Select_Search_Results.php*
  වෙබ් සබැඳිය ඔස්සේ පරීක්ෂා කළ හැකිය.

- TVEC යටතේ ලියාපදිංචි වී ඇති රජයේ වෘත්තීය පුහුණු ආයතන
  - ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA)
    *- https://naita.gov.lk/naitahome/naita-trade-list-2/*
  - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (VTA)
    *- http://vtasl.gov.lk/program/program-details/*



iii. ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM)
*- https://www.slithm.edu.lk/courses/*

iv. කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET)
*- http://dtet.gov.lk/en/course-details/*

v. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු පාඨමාලාව.
(ගෘහස්ථ ගෘහපාලන සත්කාරක පුහුණු පාඨමාලාව, සාත්තුසේවා පුහුණු පාඨමාලාව ආදිය)

## 02. භාෂා ප්‍රවීණතාවය ලබාගන්න

- රැකියාව කිරීමට බලාපොරොත්තු වන රටෙහි භාෂාව පිළිබඳ නිපුණතාවය සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය.

උදා:

| | |
|---|---|
| ජපානය | - ජපන් භාෂා ප්‍රවීණතා විභාගයන් සමත් වීම. (JLPT, NAT හෝ JFT විභාග) |
| කොරියාව | - කොරියානු මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන කොරියානු භාෂා විභාගය සමත්වීම. |
| මැදපෙරදිග රටවල් | - අරාබි භාෂාව, ඉංග්‍රීසි භාෂාව |
| අනෙකුත් රටවල් | - අදාල රටෙහි භාෂාව, ඉංග්‍රීසි භාෂාව |

## 03. වෘත්තීයට අදාල රැකියා පළපුරුද්දක් ලබාගන්න

- අපේක්ෂිත වෘත්තීයට අදාලව අවම වශයෙන් එක් වසරක්වත් රැකියාවේ යෙදී පළපුරුද්දක් ලබාගැනීම.

## 04. පෙර විගමණික පුහුණුව ලබාගන්න

- වෘත්තීය නොවන හෝ ගෘහස්ථ අංශයේ හෝ විදේශ රැකියා සඳහා ප්‍රථම වතාවට යොමුවන අයවලුන් සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පවත්වනු ලබන දින 02ක පෙර විගමණික නම්නීකරණ පුහුණු පාඨමාලාව සම්පූර්ණකර තිබීම.

